ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දූරකථනය: +94 (11) 249-8100  ෆැක්ස්: +94 (11) 244-9070
විද්‍යුත් තැපැල: VanHornNT@state.gov  වෙබ්: http://lk.usembassy.gov

නිවේදන අංක: 20190517

**රාජ්‍ය ලේකම් පොම්පෙඕගේ වෙසක් දින පණිවුඩය**

මැයි 16, 2019: එක්සත් ජනපදයේ ජනතාව වෙනුවෙන් මැයි 18 දින වෙසක් උත්සවය සමරන සියළු දෙනාටම සාමය හා සතුට පිරි වෙසක් දිනයක් වේවායි ප්‍රාර්ථනා කරමි.

බුද්ධ ධර්මයේ නිර්මාතෘ සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේ සිහිපත් කරන්නට ලොව පුරා බෞද්ධ ජනතාව එක්ව සිටින මොහොතේ, දයානුකම්පාව, ත්‍යාගශිලීබව සහ සාමය වැනි සාරධර්මවලට අප ගරු කරන්නෙමු.

එක්සත් ජනපදයේ බෞද්ධ ප්‍රජාව අපේ රටේ සහ අපේ ජනතාවගේ ශක්තියට දායක වේ. එසේම, වසර දෙදාහකට වඩා වැඩි කාලයක සිට බුදු දහම ලෝකයට ලබා දී ඇති දායකත්වය අපේ සංස්කෘතිය හා ඉතිහාසය පොහොසත් කොට ඇත.

ඔබ සියළු දෙනාටම සාමකාමී හා ප්‍රීතිමත් වෙසක් දිනයක් වේවා.